**<u>මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.03.14 දින පැවති මහා සභාවේ වාර්තාවයි.</u>**

2022.03.14 වන දින පෙ.ව.9.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
අද දින සභා රැස්වීමට පැමිණ සිටින ඔබ සියලු දෙනා ඉතා ආදරයෙන් පිළිගන්නා අතර, අද දින සභා රැස්වීම ආගම සිහි කිරීමෙන් අනතුරුව ආරම්භ කරමු. අනතුරුව පසුගිය සභාවේ සභා වාර්තාව සභා අනුමැතිය සදහා ඉදිරිපත් කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
පසුගිය සභා රැස්වීමේදී ගරු උප සභාපතිතුමාගේ ලිපිය පිළබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී මා විසින් ඉදිරිපත් කරන ලද කරුණක් සභා වාර්තාවට ඇතුලත් කරලා නැහැ. එමෙන්ම "Home Shop" පිළබඳව මම ප්‍රශ්න කරලා තිබුණා. ඒ සදහා ගරු සභාපතිතුමිය "දේශපාලනය වුනාම එහෙම තමයි" කියා පැවසූ නමුත් ඒ කරුණත් වාර්තාවට ඇතුලත් වෙලා නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
"Home Shop" පිළිබඳව ඔබ කිසිවක් පැවසුවේ නැහැනේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
"Home Shop" සම්බන්ධ නාම ලේඛනය පිළිබඳව කියවන අවස්ථාවේදී, "දේශපාලනය වුනාම එහෙම තමයි" කියා, අපි සිටින කාලේ මෙහෙම තමයි, ඔබ සිටින කාලෙත් එහෙම තමයි කියන අදහස ඔබතුමිය ප්‍රකාශ කරලා තිබුණා. ඒ කාරණාව වාර්තාවේ සදහන් වෙලා නැහැ. පටිගත කිරීමට සවන් දුනොත් තේරුම් ගන්න පුළුවන්.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
පටිගත කිරීම පරීක්ෂා කර බලන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
2022.02.11 වන දින පැවති සභා රැස්වීමේදී ගරු මන්ත්‍රීවරුන් වන පී.ආනන්දන් සහ එස්.සුරේෂ්කුමාර් යන මන්ත්‍රීවරුන් දෙදෙනා විසින් ඉදිරිපත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිළිබඳ වූ යෝජනාවේ තීරණයට අනුව අදාළ ආයතන වෙත ලිපි යොමු කර තිබේද? එසේ නම් මා වෙත එම ලිපියේ පිටපතක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔව් ලිපිය යොමු කරලා තියෙනවා. එම ලිපියේ පිටපතක් ඔබ තුමා වෙත ලබා දෙන්නම්.

**<u>ගරු මන්ත්‍රී වී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
පසුගිය සභා වාරයේ වාර්තාව නිවරැදි බවට මම යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මීළගට මාගේ විශේෂ කතාව ඉදිරිපත් කිරීමට සූදානම් අතර එහිදි වැදගත් කරුණු දෙකක් ඉදිරිපත් කරමි. ඉන් පළමුවන කාරණාව වන්නේ නල්ලතන්නියේ මකර තොරණ ආශ්‍රිත ජලය පවිත්‍ර කිරීමේ මධ්‍යස්ථානය සහ වැසිකිළි පද්ධතිය පිළිබඳවයි. මෙම වැසිකිළි පද්ධතියේ මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යටතේ ශ්‍රීපාද වන්දනාවට පැමිණෙන බැතිමතුන්ගේ භාවිතය සදහා දිර්ඝ කාලයක් ලබා දී තිබුණා. නමුත් එම වැසිකිළි පද්ධතියේ ධාරිතාව සහ අනෙකුත් යටිතල පහසුකම් ආදිය එම ස්ථානයට පැමිණෙන බැතිමතුන් හට ප්‍රමාණවත් නොවුණි. එනිසා එම ස්ථානයට පැමිණෙන මහජනතාවගෙන් සහ මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්ගෙන් විශාල පැමිණිලි ප්‍රමාණයක් ලැබෙමින් තිබුණා. මෙම ප්‍රශ්නයට සභාවේ ප්‍රතිපාදන මගින් විසදුම් ලබා දීමට සුදුසු මුල්‍ය තත්වයක් පැවතියේ නැහැ.එනිසා මෙම ගැටළුවට වහාම විසදුමක් ලබා ගැනීම සදහා රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මැතිතුමාට සහ නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාමේෂ්වරන් මැතිවරුන්ගේ අවධානය සදහා යොමු කළා. මෙම ගැටළුවේ වැදගත්කම වටහා ගනිමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමේෂ්වරන් මැතිතුමා සහ රාජ්‍ය අමාත්‍ය ගරු  ජීවන් තොණ්ඩමන් මැතිතුමා මගින් නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්තුමා වෙත මෙම ගැටළුව යොමු කළා.

ඒ අනුව දිස්ත්‍රික් ලේකම්තුමාගේ ඉල්ලීමක් මත ජල සම්පාදන සහ සෞඛ්‍ය ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් තුන් කෝටි අනූ ලක්ෂයක වියදමින් ව්‍යාපෘතියක් ආරම්භ කර දැනට මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර පසුගිය සතියේදී මා විසින් මෙම වැසිකිළි පද්ධතිය මහජනතාවගේ ප්‍රයෝජනය සදහා ලබාදීමට කටයුතු සිදු කරන ලදී. එබැවින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් ගරු රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මැතිතුමාට ද, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමේෂ්වරන් මැතිතුමාට ද හිටපු දිස්ත්‍රික් ලේකම් සහ දැනට සිටින දිස්ත්‍රික් ලේකම් වරුන් වෙතද, ජල සම්පාදන සහ සෞඛ්‍ය ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙතද, ප්‍රාදේශීය ලේකම් වෙත ද විශේෂ කාර්ය බලකාය වෙතද, මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. තවද මෙතෙක් කාලයක් ශ්‍රී පාදස්ථානය වන්දනා සමයේදි මහජනතාවට මුහුණ දීමට සිදුවූ මෙම ගැටළුව සදහා මා හට විසදුමක් ලබා දීමට හැකිවිම පිළිබඳව මා ආඩම්බර වෙමි.

දෙවන කාරණාව වශයෙන් 2022 වර්ෂයේදී අයවැය මගින් කාන්තා ප්‍රවර්ධන කටයුතු සදහා වෙන්කල ප්‍රතිපාදන යටතේ 2022 වර්ෂයේදී ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් මස්කෙළිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි බල ප්‍රදේශය තුල ගැබිණි මවුවරුන් සදහා අත්‍යවශ්‍ය භාණ්ඩ තොගයක් ලබාදීම 2022.03.09 වන දින මා විසින් මස්කෙළිය රෝහලේදී සිදු කරන ලදී. මේ සදහා 2022 වර්ෂයේ අයවැය සදහා ඡන්දය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රීවරුන් සහ සියලුම නිලධාරීන් වෙත මාගේ ස්තූතිය පුද කරමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මීළගට සභාව වෙත ලැබී ඇති ලිපි සහ වෙනත් පැමිණිලි ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**

**යොමුව** - පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත

**විෂය** - පොලිතීන් ආහාර ඇසුරුම් (ලන්ච්ෂීට්) භාවිතය නවතාලීම සම්බන්ධ ලිපිය

**ලිපි අංක 02**

**යොමුව** - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය

**විෂය** - මිඩ්ලෝදියන් වතු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සම්බන්ධ ලිපිය

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**

මෙම ලිපිය සම්බන්ධයෙන් මාගේ අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. දැනට රටේ පවතින තත්වය අනුව සිමෙන්ති වැනි භාණ්ඩ වල මිල වැඩි වෙමින් පවතිනවා. ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය නිම කිරීමට කොපමණ මුදලක් වැය වේවිද කියා දන්නේ නැහැ. දැනට ජයග්‍රහණය කළ ගරු මන්ත්‍රීවරුන් හට මුදල් අමාත්‍යතුමා ලබා දී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙවැනි ගැටළු මතු වෙනවා. මිල වැඩි වීම නිසා කොන්ත්‍රාත් කරුවන් බිය වෙනවා. මේ සදහා කුමක් කල යුතුද?, මෙම ලිපියට අනුව තව කාලය දිර්ඝ කිරීමක් ලබා දෙන්න. අනෙක් කාරණා වලදීත් තිබෙන්නේ මෙවැනිම ගැටළු තමයි. මෙම ලිපිය සම්බන්ධව මෙම කරුණු අතුලත් කර ගන්න.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මෙම ව්‍යාපෘතිය පළාත් සභා ප්‍රතිපාදන හා සම්බන්ධවයි. ඔබතුමා පවසන කාරණාව පිළිබඳව අපි ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීමේදී කතා කරමු. එහිදී කතා කළොත් තමයි තීරණයක් ලැබෙන්නේ.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂකතුමා දිස්ත්‍රික් මට්ටමින් කටයුතු කරන බැවින්, මෙවැනි ගැටළු සියලුම කොන්ත්‍රාත් කරුවන් හට තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව සභාවේ ඒකමතිකව තීරණයක් ලබා ගෙන දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂකතුමා වෙත ලිපියක් යොමු කරමු.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මෙම මිලියන හතරක ව්‍යාපෘතිය පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී තමයි තීරණය කරන්නේ. අවශ්‍ය නම් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අපි ලිපියක් යොමු කරමු. අපිට තීරණ ගන්න බැහැ.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

අපි කියන්නෙත් දිස්ත්‍රික් සැලසුම් කමිටුව වෙත ලිපියක් යොමු කරමු කියලයි. තව කාරණාවක් කියන්න අවශ්‍යයි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ගරු සභාපතිතුමිය කිසිම දෙයක් කතා කරන්නේ නැහැ. මෙය අපි ඇස් දෙකෙන්ම දැක්ක දෙයක්.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

එහිදී කතා කිරීමට අවශ්‍ය දේවල් මම ඉදිරිපත් වෙලා කතා කරලා තිබෙනවා. ගැටළු පිළිබඳව ඔබතුමා තමයි කතා කරන්න ඕන.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

අඹගමුව සභාපතිතුමා සහ අනෙකුත් සභාපතිවරුන් කතා කළා. මෙම කාරණාව පිළිබඳව කතා කළාද කියා මම ගරු මන්ත්‍රී සුරේෂ් මැතිතුමාගෙන් විමසුවා. එතුමා නැහැ කියා පැවසුවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

ඔබතුමාට වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිබඳව මම කොහොමද කතා කරන්නේ. මම පොදුවේ ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව තමයි කතා කරන්නේ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ සැලසුම් කමිටු ආදි කමිටු තිබෙනවා. එහිදී මම මොනවද කරන්නේ. මම බාධා කළා වගේ වෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, මෙම කරුණු මතු කරලා කතා කරන්න පුළුවන් නේද? ගරු මන්ත්‍රීවරුන්ට එහිදී කතා කිරීම සඳහා ලබා දෙන වෙලාව ඉතාම සීමිතයි . ඔබතුමිය සඳහා වෙලාව ලබා දෙනවා නේද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
තම තමන්ට ඇති ගැටළු කතා කරන්න පුළුවන්. එහිදී කාටවත් කතා කරන්න එපා කියා කීවේ නැහැ නේද?

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
වෙලාව වෙන් කිරීමම වැරැදියි නේ. අඹගමුව සභාපතිතුමා විනාඩි පහළොවක් කතා කරනවා. ඔබතුමිය ඒ තරම් කතා කරන්නේ නැහැනේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
එතුමා කතා කරයි. එතුමා තමයි පක්ෂ සංවිධායක. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු උප සභාපතිතුමා පැමිණියේ නැත්නම් එතුමාට තමයි කතා කරන්න කියන්නේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාවේදී සමහර තීරණ ලබා ගෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී කතා කරන බවට ඔබතුමිය පවසනවා. අපිත් එම විශ්වාශය මත තමයි කටයුතු කරන්නේ. ඒ හා සම්බන්ධ වූ කරුණු එහිදී කතා කරන්නේ නැත්නම් සභාවේදී ඔබතුමිය කතා කරන එකේ තේරුමක් නැහැනේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මම කතා කළේ නැහැ කියලා ඔබතුමා කෙහොමද දැන ගත්තේ? සමාජය වෙනුවෙන් කතා කළ යුතු දේවල් මම කතා කරලා තිබෙනවා. වැදගත් කරුණු පමණයි මම කතා කරන්නේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මීට පෙර ඡන්ද හිමි නාම ලේඛනය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරලා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී කතා කරන බවට පැවසුවා. එලෙස එහිදී කතා කර තීරණයක් ලබා ගෙන තිබුණානම් මම ඇයි මේ වතාවෙත් එම යෝජනාව ඉදිරිපත් කරන්නේ. සභාවේ දී සාකච්ඡා කරන කරුණු එහිදී කතා කරන්න. නැතිනම් තීරණයක් ලබා ගෙන අපට භාර දෙන්න. අපි ගොස් කතා කරන්නම්. මට කිසිම බයක් නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මෙහිදී සාකච්ඡා කරන කරුණු මම කතා කරලා තිබෙනවා. කතා කළේ නැහැ කියලා කියන්න බැහැ. අනවශ්‍ය දේ මට එහි ගොස් කතා කරන්න බැහැ. ඡන්ද නාම ලේඛනය පිළිබඳව ග්‍රාම නිලධාරී මගින් අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතිනවා.

**තීරණ අංක 01**
ඉහත සඳහන් ලිපියට අනුව අදාළ ව්‍යාපෘතිය 2022 වර්ෂයේ සංවර්ධන සැලසුම සඳහා ඇතුලත් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**ලිපි අංක 03**
**යොමුව** - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
**විෂය** - 2022 ජනවාරි මස සභා වාර්තාව පිළිබඳ වූ නිරීක්ෂණ ලිපිය

**ලිපි අංක 04**
**යොමුව** - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
**විෂය** - 2022 පෙබරවාරි මස සභා වාර්තාව පිළිබඳ වූ නිරීක්ෂණ ලිපිය

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභා වාර්තාව පිළිබඳ වූ ලිපියේ වැරැදි කිසිවක් නොමැති බවට සදහන් වෙනවා. සමහර කරුණු පිළබඳ සාකච්ඡා කළද එනම් , සමෘද්ධි, ග්‍රාම නිලධාරී පිළිබඳව සාකචඡා කළ කරුණු වාර්තාවේ සදහන් නොවූවද වාර්තාවේ කිසිදු අඩුවක් නොමැති බව සදහන් වෙනවා. මා මෙවර ඉදිරිපත් කළ යෝජනාවේ මස්කෙළිය රෝහලේ විධිමත් රසායනාගාර පහසුකම් සහ අවශ්‍ය තාක්ෂණ නිලධාරීන් නොමැති බවට සදහන් කළත් එය සභාවේ නිතිමය තත්වය යටතේ ඇතුලත් කල නොහැකි බව පවසමින් ප්‍රතික්ෂේප කර තිබෙනවා. දෙවන කාරණාව වශයෙන් අපට සේවය සපයන නිලධාරීන් සදහා "නිල සෙවන" යන ව්‍යාපෘතිය යටතේ සියලුම ග්‍රාම සේවා වසම් සදහා රුපියල් ලක්ෂ 20 ක ප්‍රතිපාදන වෙන් කර එම නිලධාරීන් සදහා ගොඩනැගිලි ඉදිකර දෙනවා. එනිසා මෙය මෙම සභාවේ යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරමින් තීරණයක් ලබා ගෙන ලිපියක් යොමු කිරිමටයි එම යෝජනාව ඉදිරිපත් කළේ. නමුත් මෙම යෝජනා දෙකම න්‍යාය පත්‍රයට ඇතුලත් කර නැහැ. ඊට හේතුව කමක්ද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ සියල්ල ඔබතුමාට පැමිණිල්ලක් වශයෙන් ඉදිරිපත් කරන්න පුළුවන්. පසුගිය මාසයේ පැවති සභා වාරයේ දීත් මා මේ පිළිබඳව ඉතා පැහැදිලිව පැවසුවා. මින් ඉදිරියට සභාව නීත්‍යානුකූලවම තමයි පවත්වන්නේ.

**ලිපි අංක 05**
**යොමුව** - පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත
**විෂය** - ගරු මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් විදේශගත වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල ඇතුලත් ලිපිය

**ලිපි අංක 06**
**යොමුව** - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
**විෂය** - ගරු සභාපතිතුමියගේ සම්බන්ධීකරණ ලේකම් පිළිබඳ වූ ලිපිය

**තීරණ අංක 02**
ගරු සභාපතිතුමියගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස නව නිලධාරිවරයෙක් පත්කිරීම සදහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**ලිපි අංක 07**
**යොමුව** - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
**විෂය** - වීථි ලාම්පු භාවිතය 50% කින් අඩු කරන ලෙසට දන්වා ඇති ලිපිය

**ලිපි අංක 08**
**යොමුව** - පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත
**විෂය** - ගිණුම්කරණ ප්‍රශ්න පිළබඳ වූ ලිපිය

| **තීරණ අංක 03** |
| --- |
| ලිපි අංක 08 අනුව ගිණුම්කරණ ප්‍රශ්න සඳහා උත්තර සැපයීම එම කාල සීමාව තුලදීම සිදු කිරීමට තීරණය කරන ලදී. |

**ලිපි අංක 09**
**යොමුව** - විෂය භාරකරු - මස්කෙළිය ප්‍රාදේශීය සභාව
**විෂය** - 2021 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව

| **තීරණ අංක 04** |
| --- |
| භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභාව මගින් පිළිගැනීමත් සමග ඉවත් කරන ලද භාණ්ඩ වෙන්දේසි දැමීම මගින් විකිණීමට තීරණය කරන ලදී. |

**ලිපි අංක 10**
**යොමුව** - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
**විෂය** - 08 වෙනි වීදියේ ආයුර්වේද බෙහෙත් ශාලාව පිහිටි ඉඩම මස්කෙළිය ප්‍රාදේශීය සභාව වෙත ලබාදීම සම්බන්ධයෙන් වූ ලිපිය

**ලිපි අංක 11**
**යොමුව** - බාර්ග්‍රෝ කොටස - මහ ජනතාව
**විෂය** - මාර්ගය අළුත්වැඩියා කිරීම සම්බන්ධ වූ ලිපිය

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
පෙබරවාරි මාසයේ 22 වන දින ලියාපදිංචි ලිපියක් මගින් කුමරසෙන් යන විදුහල්පතිතුමා අංක 43, නෝටන් විදිය, මස්කෙළිය යන ලිපිනයෙන් ලිපියක් යොමු කර තිබෙනවා. එම ලිපිය කියවුණේ නැහැ

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
එම ලිපිය සභාවේ පැමිණිලි පොතේ සටහන් කර අදාල නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂණය සඳහා යොමු කර තිබෙනවා. එනිසා අදාල දෙපාර්ශවය ගෙන්වලා මේ පිළිබඳව කතා කරමු. මීළඟට මූල්‍ය සහ අනෙකුත් කමිටු වාර්තා සභාවට ඉදිරිපත් කරමු.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

මූල්‍ය කමිටු වාර්තාවේ විෂය අංක 10 යටතේ සෞඛ්‍ය උපකරණ මිළදී ගැනීම පිළිබඳ වූ කරුණු සාකච්ඡා කර තිබෙනවා. ඒ සදහා ගන්නා ලද තීරණය කුමක්ද? එසේ නැතිනම් නැවතත් මිල ගණන් කැදවීම සදහා ද? දෙසැම්බර් 31 අවසාන දිනය බවට සදහන් කරමින් මිල ගණන් කැදවනු ලැබුවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

සමහර වෙළද භාණ්ඩ වල වෙළද නාමය වෙනස් කර මිල ගණන් කැදවීමට තීරණය කර තිබෙනවා.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

මිල ගණන් කැදවා තිබුණා. එක භාණ්ඩයකට පමණක් නෙවෙයි, විවිධ භාණ්ඩ සදහා මිල ගණන් කැදවා තිබුණා. ඒ සදහා ජනවාරි 31 වන දින අවසාන දිනය ලෙසට දැනුම් දී තිබුණා. පුරුද්දක් වශයෙන් එකී දිනයට පෙර ලැබෙන මිල ගණනන් සදහන් පිළිතුරක් ලබා දෙනවා. පසුගිය සභා වාරයේදී මේ පිළිබදව කිසිම දැනුම් දීමක් කර තිබුණේ නැහැ. මා මේ පිළිබදව ඍජුවම ලේකම්තුමාගෙන් විමසුවා. නැවත මිල ගණන් කැදවන බවට ලේකම්තුමා පැවසුවා. නමුත් නැවත මිල ගණන් කැදවීමක් සිදු කළේ නැහැ. මාසයක් කල් ගොස් නැවතත් මේ මාසයේ මූල්‍ය කමිටු රැස්වීමේදී සාකච්ඡා කර තිබෙනවා. ඇත්තටම මෙහිදී අන්තර්ගත වී ඇති අරමුණ කුමක්ද? දැනට මිල ගණන් දෙකයි ලැබී තිබෙන්නේ. ඒ නිසා මෙය විවෘත කරන්න බැහැ කියා පසුගිය මූල්‍ය කමිටු රැස්වීමේදී සාකච්ඡා වුණා. 31 වන දිනට පෙර ලියාපදිංචි වූ පුද්ගලයෙකුගෙන් මිල ගණන් ලැබී තිබුණත්, ඔහුට ලබා දී තිබිය යුතුයි. එදින ලබා දුන්නේ නැහැ. නමුත් මෙම මූල්‍ය කමිටුවේදී මෙය ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැදවන බවට කියලා තියෙනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

ප්‍රතික්ෂේප කළේ නැහැ. කාලය දීර්ඝකර එවන ලෙසයි ඉල්ලා සිටියේ.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

ජනවාරි 31 වන දිනට පෙර ලැබුණු මිල ගණන් මූල්‍ය කමිටු රැස්වීමට ඉදිරිපත් කරන්න තිබුණා නේද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

එකම එක මිල ගණනක් පමණක් ලැබී තිබුණ බැවින් එය විවෘත නොකර නැවත ඉල්ලුම් කරන ලෙසට අපි පැවසුවා.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

එසේනම් ලියාපදිංචි කළ සියලුම කොන්ත්‍රාත්කරුවන් වෙත මෙම කාරණාවන් දැනුවත් කළාද? නැහැ. මා මෙම කාරණාව ඉතාමත් පැහැදිලිව පැවසීමට හේතුව මගේ නමත් ලියාපදිංචි වෙලා තිබෙනවා. එහෙම ලැබෙන්න ඕන නම් ලැබී තිබිය යුතුයි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

ඔබතුමාගේ සහ නතර්ෂා වෙළද ආයතනයේ මිළ ගණන් පමණයි ලැබී තිබුණේ. මිල ගණන් නොලැබුණු ආයතන වලට පමණයි අපි දැනුම් දීමක් සිදු කළේ.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

31 වන දිනය අවසාන දිනය වේ නම් 31 වන දිනෙන් පසුවත් මිල ගණන් කැදවීම් භාරගෙන තිබෙනවා. එසේ නම් සියලුම දෙනාගෙන් කැදවා තිබිය යුතුයි නේද? 31 වන දිනට පසුව සමහරුන්ට පමණක් කොහොමද සහන ලබා දුන්නේ. එසේ නම් මිල ගණන් සියල්ල සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරලා සියලුම දෙනාගෙන් නැවතත් මිල ගණන් කැදවන්න තිබුණා. එසේ සිදු කළේ නැහැ. අවසන් දිනයක් ලබා දෙන්නේ කුමටද? අවසාන දිනයක් ලබා දී තිබෙනවා. නීතිමය කරුණු පිළිපදිමින් මෙම මිල ගණන් කැදවීම සිදුකර තිබෙනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ඔව්, 02 ක් පමණක් තිබුණ නිසා නැවතත් කැදවලා කාලය දීර්ඝ කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

මිල ගණන් මෙපමණ ප්‍රමාණයක් ලැබුනොත් පමණයි එය විවෘත කරන්නේ කියා ඔබතුමිය කොතනකවත් සදහන් කරලා නැහැ. ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය මම හොදින් දන්නවා. ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුව නියමිත වෙලාවට එක ටෙන්ඩර් පතක් ලැබුණත් එය විවෘත කරන්න ඕන. මිල ගණන් කැදවිමත් මේ අනුවමයි ක්‍රියාත්මක විය යුත්තේ. මේ සදහා වූ පිළිතුර මා ලිඛිතව බලාපොරොත්තු වෙනවා. මගේ අදහස අනුව ඔබතුමිය බලාපොරොත්තු වූ අයගේ මිල ගණන් එදින ලැබුණේ නැහැ. ඒ නිසා තමයි ලැබී තිබුන මිල ගණන් එදා විවෘත කළේ නැත්තේ. මේ අවුරුදු හතරටම සභාවට අවශ්‍ය භාණ්ඩ සපයන ලද්දේ එකම පුද්ගලයෙකු විසිනුයි. පසුගිය අවුරුදු 04 ක කාලය තුල ලැබුණු සියලුම මිල ගණන් මට පෙන්වන්න. එවිට මිල ගණන් කීයක් ලැබුණද කියා දැනගන්න පුළුවන්.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මූල්‍ය කමිටු වාර්තාවේ එකොළොස් වන කාරණාවට අනුව ගැබිණි මවුවරුන් සදහා භාණ්ඩ ලබාදීම සම්බන්ධව සාකච්ඡාකර තිබෙනවා. හොද කාර්යයක්. ගරු සභාපතිතුමියට ස්තුතියි. කී දෙනෙකුටද ලබා දුන්නේ? කොපමණ මුදලක් වැය කළාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

රුපියල් 96000.00 ක් වැය කරමින් ගැබිණි මවුවරුන් 35 දෙනෙකුට ලබා දී තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මූල්‍ය කමිටු වාර්තාවේ මෙම කාරණාව නිර්දේශයක් වශයෙන් නේද තියෙන්නේ? සභාවේ අනුමැතිය සදහා මෙය ඉදිරිපත් කර තියෙනවාද? වෙනත් කරුණු ක්‍රියාත්මක කිරිම සදහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. නමුත් මෙම කාර්ය සිදුකර අවසන් කර තිබෙනවා. මෙයත් අයවැය වාර්තාවේ සදහන් කරුණක් නේද? අයවැය දෙසැම්බර් මාසයේ අනුමත කර අවසන් නේද? එසේ නම් නියමිත දිනයේදී මෙම කාර්ය ඉටු කරන බවට දන්නවා නේද? එසේ නම් පසුගිය සභා වාරයට හෝ මෙම කරුණ ඉදිරිපත් කරන්න තිබුණා නේද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මෙවැනි ගොඩක් දේවල් සිදු කර අවසන් වීමෙන් පසුව වැය ලේඛනයට සදහන් කර තිබෙනවා නේද? , තවත් කරුණක් මූල්‍ය කමිටුවට යම්කිසි මුදලක් නිර්දේශ කරන්න පුළුවන් නේද?

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, මේවා සභාවේ මුදල්. මෙය වියදම් කිරීමේදී සභාවේ සිටින සියලුම ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කළ යුතුයි නේද? කවුරුවත් දන්නේ නැහැ. ගරු මන්ත්‍රී රාජ්කුමාර් මැතිතුමා පවසන පරිදි වීථි ලාමුපු සවි කිරීම සදහා කුඩා භාණ්ඩයක් මිලදී ගැනිමේදී වුවත් සභාවේ අනුමැතිය ලබා ගන්නවා. මේ සදහා අනුමැතිය ලබා ගත්තේ නැහැනේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
නියමිත කාලය තුල මෙය අවසන් කළ යුතු නිසා මූල්‍ය කමිටුවේ නිර්දේශය ලබාගෙන මෙම කාරණාව ක්‍රියාත්මක කළා. අයවැයේදී වුවත් කාන්තාවන් සදහා යම් ප්‍රතිපාදන වෙන් කර අයවැය ද අනුමත කරගෙන තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
එසේ නම් ඇයි අනෙකුත් මන්ත්‍රීවරුන් දැනුවත් කළේ නැත්තේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අයවැය වාර්තාවට පක්ෂව ඡන්දය ලබාදුන් අය පමණයි සහභාගී වුණේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
කෝ, පක්ෂව ඡන්දය දුන් අයත් නැහැනේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඔබතුමියගේ විශේෂ දැනුම් දීමේදී අයවැය වාර්තාවට පක්ෂව ඡන්දය ලබාදුන් අය පමණක් කැදවන ලද බවට පැවසුවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔව්. අයවැය වාර්තාවට පක්ෂව ඡන්දය ලබාදුන් අයට මම ස්තූති කළ යුතුයි නේද? ලබාදුන් අයට ස්තූති කළයුතු නැද්ද?

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මේ පිළිබදව ලේකම්තුමාගෙන් මම විමසන අවස්ථාවේදී මෙය මගේ සැලසුමක් නොවෙයි, සියලුම දේවල් ගරු සභාපතිතුමියගේ තීරණය අනුව සිදු කළ බවට ඔහු පැවසුවා. මෙය ඔබතුමියගේ පෞද්ගලික කාර්යයක් නම් අපගේ විරුද්ධතාවයක් නැහැ. මේවා සභාවේ මුදල්. මහජවතාවගේ මුදල්. යම්කිසි පිරිසක් පමණක් තබාගෙන මෙම කාර්ය සිදු කිරීම අනුමත කරන්න බැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මෙම සභාවේ මුදල් අයවැය වාර්තාව අනුමත කර ගැනීමට ඒ යම්කිසි පිරිසක් තමයි පක්ෂව ඡන්දය ලබා දුන්නේ. එහෙම නම් ඒ අයට මම කියන්න ඕන.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
වාර්තාවට ඇතුලත් කරගන්න. අයවැය වාර්තාවට පක්ෂව ඡන්දය ලබා දුන් අයට පමණයි ලු සියලුම දේවල් දැනුම් දෙන්නේ. අනිත් අයට ආරාධනා නැතිලු.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සුපුරුදු ආකාරයට මූල්‍ය කමිටුවේ දී සාකච්ඡා කළ කරුණු මාසික සභා රැස්වීමේ දී අනුමැතිය ලබාගත් පසුව තමයි යම් වැය කිරීමක් සිදු කළ යුත්තේ. මෙතෙක් කල් එහෙමයි සිදු වුණේ.

නමුත් දැන් භාණ්ඩ බෙදා හැරීම සිදු කර පසුව මෙම මුදල් කමිටු වාර්තාව සහා අනුමැතිය සදහා ඉදිරිපත් කරන්නේ ඇයි? සෑම වතාවකම මුදල් කමිටු නිර්දේශය සදහා සෑම ගරු මන්ත්‍රීවරයෙක්ම යම්කිසි යෝජනාවක් ඉදිරිපත් කරනවා. සමහර අවස්ථාවලදී එහි සංශෝධන කිරීමටත් සිදු වෙනවා. මෙහිදී සංශෝධන කිරීමටත් කිසිවක් නැහැනේ. භාණ්ඩ බෙදා හැරීම් සිදුකර අවසානයි. ඒ වගේ වියදම් කර දැන් සභාවට ඉදිරිපත් කිරීමට කිසිම කරුණක් නැහැනේ. මෙය තමයි පළමුවන අවස්ථාව. මෙය ඉතා හොද වැඩසටහනක්. ඒ පිළිබඳව අපට කිසිදු ගැටළුවක් නැහැ. ඇයි සභාවට මෙය ඉදිරිපත් කළේ නැත්තේ? මේ වගේ සභාවේ අනුමැතිය නොමැතිව ක්‍රියාත්මක කර නැවත සභාවට ඉදිරිපත් කළ යම්කිසි වැඩසටහනක් තිබෙනවානම් කියන්න බලමු.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

කොවිඩ් 19 වසංගත කාලයේ දී විෂබීජ නාශක ද්‍රව්‍ය ලබාගෙන තිබෙනවා. ඒවා මිළදී ගෙන පසුව තමයි සභාවට ඉදිරිපත් කළේ.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

නැහැ එය සභාවට ඉදිරිපත් කර පසුව තමයි බෙදා හැරියේ.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු සභාපතිතුමියනි, කොවිඩ් 19 වසංගත කාලයේ දී ලබා දුන්නේ එය හදිසි අවශ්‍යතාවයක් නිසා. නමුත් මෙම කාරණය එවැනි හදිසි අවශ්‍යතාවයක් නොවෙයි නේද? සාමාන්‍යයෙන් රුපියල් පන්දාහක් වියදම් කිරීම සදහාත් සභාවේ අනුමැතිය ලබා ගන්නවා නේද? කාන්තා දිනය වෙනුවෙන් ලබා දෙනවානම් මේ මාසය තුළදී ලබා දෙන්න පුළුවන්. එය ප්‍රශනයක් නෙවෙයි. මෙවැනි කාරණාවක් ඉදිරිපත් කරන නිසා මම කාන්තා විරෝධි පුද්ගලයෙක් නෙවෙයි. මම රෝහලේ ලේකම්. එම ප්‍රතිපාදන යොදා ගෙන භාණ්ඩ ලබාදීම පිළිබඳව ස්තූතිය පුද කරනවා. නමුත් සභාවේ රුපියල් ලක්ෂයක මුදලක් වැය කිරීමේදී අනිවාර්යයෙන් සභාවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතුයි. අයවැයේදී අනුමැතිය ලබාගෙන තිබුණද සභාවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතුයි නේද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මූල්‍ය කමිටුවේ නිර්දේශය මත තමයි අපි වියදම් කළේ. මූල්‍ය කමිටුව අනුමැතිය ලබා දුන්නා නම් එය ක්‍රියාත්මක කළ යුතුයි නේද?

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු සභාපතිතුමියනි, පසුගිය කාලවලදී මූල්‍ය කමිටුව සුළු සුළු කරුණු සදහාද නිර්දේශ ලබා දී තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කළේ නැහැ. උදාහරණයක් වශයෙන් පළුදු වූ වීථි ලාම්පු අළුත්වැඩියා කිරීම සදහා වුවද මෙතෙක් කටයුතු කර නැහැ. සමහර විථි ලාම්පු ගලවලා දැනට මාස 06 ක් 07 ක් පමණ වෙනවා. ඒවා ඉටු කරන්න බැහැ. රුපියල් 2000.00 කට වඩා අඩුවෙන් වියදම් වන විථි ලාම්පුවත් මාරු කරලා දාන්න බැහැ. නමුත් දැන් මූල්‍ය කමිටුවේ නිර්දේශය ලබාගෙන මෙම වැඩසටහන කරන්න පුළුවන්. ඔබතුමියට අවශ්‍ය දේවල් මූල්‍ය කමිටුවේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කරනවා. අනිත් ඒවා ක්‍රියාත්මක කරන්නේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

කාන්තාවන්ට මම කවදත් ගරු කරනවා. කාන්තාවන් සදහා වූ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව ස්තූතියි. නමුත් මූල්‍ය කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කළේ නම් මෙය කාන්තාවන් සදහා ඉතා වැදගත් වැඩසටහනක් බව ප්‍රකාශ කර මෙම කාර්ය ක්‍රියාත්මක කරන ලෙසට අපි පවසනවා. නමුත් මෙම කාර්ය අවසන් කර සභාවට ඉදිරිපත් කරන

අවස්ථාවේදී යම් යම් හේතු නිසා මෙය අධිභාරයට ලක් වුවහොත් සියලු දෙනාටම ගැටළුවක් වෙනවා. මූල්‍ය කමිටුව නිර්දේශය පමණයි ලබාදී තිබෙන්නේ. සභාවේ අනුමැතිය ලබාදී නැහැ. කාන්තාවන් සදහා මීට වඩා විශාල වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. කිසිම ගැටළුවක් නැහැ. නමුත් සභාවට ඉදිරිපත් කරන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මූල්‍ය කමිටුවේ නිර්දේශය සමඟ තමයි ක්‍රියාත්මක කරලා තියෙන්නේ. සභාවට ඔබතුමා පමණක් නොවෙයි අනෙක් මන්ත්‍රීවරුන්ගේත් අනුමැතිය ලබාගත යුතුයි නේද?

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
එසේ නම් මගේ පෞද්ගලික අදහස, මේ පිළිබඳව අප කිසිම දෙයක් දන්නේ නැහැ. ක්‍රියාත්මක කර අවසන් වු වැඩසටහනක් සදහා සභාවේ අනුමැතිය ලබා ගැනීම පිළිබඳව මාගේ විරෝධතාවය පල කරමි. මේ පිළිබඳව කුමක් සිදු වුවත් ඒ සදහා මම සම්බන්ධ නොවන අතර වගකිව යුතුත් නැහැ.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, ඔබතුමියගේ අදහසට අනුව සභාවේ මූල්‍ය කටයුතු පිළිබඳ වූ කරුණු සදහා මූල්‍ය කමිටුව පමණක් නිර්දේශ කළාම ප්‍රමාණවත් බවට තීරණයක් ලබා ගනිමු. සභාවේ අනුමැතිය සදහා ඉදිරිපත් කළ යුතු නැහැ.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටුව සම්බන්ධ ප්‍රශ්නය මතු කරන විට ඔබතුමන්ලා කළින් පැවසුවේ මුදල් කමිටුවෙන් තීරණය ගන්න පුළුවන් කියා. නැවතත් අපි ප්‍රශ්න මතු කරන විට අපි ඒ කියන එක පිළිගන්නේ නැහැ. එනිසා කුමන හෝ ක්‍රමයකට එන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
රුපියල් ලක්ෂ පහක් දක්වා වූ වියදම් ගරු සභාපතිතුමියගේ අනුමැතිය යටතේ සභාවේ වියදම් කළ හැකි බවට පසුගිය කාලයේ තීරණයක් ලබා ගෙන තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
රුපියල් ලක්ෂ පහක් දක්වා ගරු සභාපතිතුමියගේ අනුමැතියට යටත්ව වියදම් කළ හැකි නම් මෙම වාර්තා සභාවට ඉදිරිපත් කරන්නේ ඇයි?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
සභාවට ඉදිරිපත් කළ යුතු නිසා තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ. මීට පෙර මූල්‍ය කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන්නේ නැහැ. අපි බලා ගත යුතු නිසා තමයි සභාවට ඉදරිපත් කරන්නේ.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**
සිදු කරන ලද මෙම කාර්ය ඉහළින්ම අගය කල යුතු කාර්යයක්. ගරු සභාපතිතුමියට පවරා ඇති බලතල අනුව හෝ මූල්‍ය කමිටුවේ කරන ලද නිර්දේශය අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ බවට අදහස් ඉදිරිපත් වුණා. මෙහිදී මූල්‍ය කමිටුව වෙනුවෙන් මෙතෙක් වෙලා පිළිතුරු ලබා දෙමින් සිටින්නේ ගරු සභාපතිතුමිය පමණයි. අනෙක් මූල්‍ය කමිටු සාමාජිකයින් නිශ්ශබ්දව සිටීම මෙහිදී මතභේදයක් ඇති කරනවා. මේක මගේ අදහසක්. තවත් කරුණක්, එනම් සභාවේ මුදල් භාවිතා කරමින් යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා නම් සභාවේ

අනුමැතිය ලබා ගැනීම සුපුරුදු කාර්යයක්. සභාපතිට හා මූල්‍ය කමිටුවට යම් යම් බලතල තිබෙනවා. නමුත් මෙහිදී මූල්‍ය කමිටුවේ අදහස් ඉදිරිපත් වුණේ නැහැ. එනිසා මූල්‍ය කමිටු සාමාජිකයන්ගේ අදහස් ඉදිරිපත් කරන්න.

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>**

මුදල් කමිටුව රැස්වෙලා සමාජයට යම්කිසි සේවයක් කරන්න අවශ්‍ය බව පවසනවා නම් එයට මුදල් කමිටුව හරි වැරැදි නිගමනය කර තමයි තීන්දු තීරණ ලබා ගන්නේ. මවුවරු 35 දෙනෙකුට කාන්තා දිනය වෙනුවෙන් භාණ්ඩ ලබා දෙන්නේ එලෙස සාකච්ඡා කර තීන්දු තීරණ ගැනීමෙන් පසුවයි. මම මුදල් කමිටුවේ සාමාජිකයින් නිහඬව සිටියා කිවුවේ ඒ ප්‍රශ්නය ඔවුන් ඇසුවේ සභාපතිතුමියගෙන්. මුදල් කමිටුවෙන් නොවේ. සභාපතිතුමියට යම් කිසි තීන්දු තීරණ ගන්න පුළුවන් නම් ඔබතුමිය කොහොමද මුදල් කමිටුවෙන් අනුමැතියක් අරගෙන කොහොමද මුදල් පරිහරණය කළේ කියා විමසා එහි නීතිමය පැත්තෙන් කටයුතු කරන්න ඔබට පුළුවන්. මෙතැන වාද විවාද නොකර අදාල ආයතන හා අදාල නීතියත් සමග ක්‍රියාත්මක වී මෙම මුදල කොහොමද මෙතැනින් වෙන් කර ගත්තේ කියා විමසුවා නම් ඔවුන් එම නීතියට පිළිතුරු ලබා දෙයි. එසේ නොකර මෙහි වාද විවාද කර සභාපතිතුමිය හා මන්ත්‍රීවරුන් අතර ගැටුම් ඇති කර ගත යුතු නැහැ. එයට මුදල් කමිටුව අනුමැතියක් දුන්නා. එය ක්‍රියාත්මක කළා. එයට විරුද්ධත්වයක් කරනවානම් එම අදාල ආයතනයට විරුද්ධතාවය පල කරන්න. එවිට එම ආයතනයෙන් ඒ සඳහා පිළිතුරු ලබා දෙයි.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**

ගැබිණි මවුවරුන් සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ ලබාදීම ඇත්තටම අගය කල යුතු කාර්යයක්. නමුත් මෙම මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමිය ඇතුළු කොට්ඨාශ 10 ක මන්ත්‍රීවරුන් අපි 16 දෙනෙක් ඉන්නවා. මෙම කොට්ඨාශ 10 න් කවුරුන් හටද මෙම අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දුන්නේ කියා කවුරුත් දන්නේ නැහැ. මමත් මෙම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක්. මටත් එක්තරා කොට්ඨාශයක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ කී දෙනෙකුට මේවා ලැබුණාද කියා මම දන්නේ නැහැ. එනිසා මේවා ලබා දුන්නේ කාටද කියන විස්තරත් ඉදිරිපත් කළා නම් වඩාත් සුදුසුයි කියන එකයි මගේ අදහස. සභාවේ ප්‍රතිපාදන මගින් වැය කර සිදු කරන ලද කාර්යයක් නිසා සියලුම මන්ත්‍රීවරුන් දැනුවත් කළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රීතුමනි, මාසික සායනයට පැමිණෙන ගැබිණි මවුවරුන් එන්නේ රෝහලට. ප්‍රාදේශීය සභාවට එන්නේ නැහැ. කුමන ප්‍රදේශ වලට අයත්ද කියන විස්තර තියෙන්නේ රෝහලේ. අපි කාන්තා දිනය වෙනුවෙන් වැඩසටහනක් සිදුකරන බවත් එම ගැබිණි මවුවරුන් රෝහලට පැමිණෙන්නේ කුමන දිනයේද කියාත් විමසුවා. ඒ අනුව තමයි එදින වැඩසටහන අපි සංවිධානය කළේ.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**

නමුත් අපි කාටද ඒවා ලබා දුන්නේ කියන විස්තර ලබා ගත යුතුයි නේද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

අපි ලබා දුන්නේ ගැබිණි මවුවරුන් සඳහා. ඒවා තමයි ඡායාරූප වලත් දාලා තියෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාව මගින් අපි එක වීථි ලිම්පුවක් සවිකලත් එම වීථි ලාම්පුව සවි කළේ කොහෙද? එම ස්ථානය කොහොමද තියෙන්නේ? යන වශයෙන් ඡායාරූප ඉල්ලනවා. එනිසා සභාව මගින් භාණ්ඩ ලබාදෙන අවස්ථාවේ දී අපි කාටද ලබාදුන්නේ කියන විස්තර අවශ්‍යයි නේද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගැබිණි මාතාවන්ට තමයි ලබා දුන්නේ. මේ පිළිබඳව ලිපි ලේඛන, සහ ඡායාරූප සියල්ල තිබෙනවා. මේ පිළිබඳව ගැටළුක් මතුවන අවස්ථාවේදී ඒ සියල්ල අපි ඉදිරිපත් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**
මස්කෙළිය රෝහලට කොට්ඨාශ 10 ම සිටින ගැබිණි මවුවරුන් පැමිණෙන්නේ නැහැ. එක් එක් කොට්ඨාශ වලට වෙනම ස්ථානයක් යෝජනා කර එම ස්ථානයේ තමයි මාසික පරීක්ෂණය පවත්වන්නේ. බොහෝ දුරට මස්කෙළිය රෝහලට පැමිණෙන්නේ මස්කෙළිය නගරය ආශ්‍රිත ප්‍රදේශ වල සිටින ජනතාව වෙන්න ඕන. ඈත දුෂ්කර ප්‍රදේශවල  දුප්පත් ගැබිණි මාතාවන් ඉන්නවා. ඒ අයට මේවා ලැබුණාද කියන විස්තරයක් අපට දැන ගැනීමට අවශ්‍යයයි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අවශ්‍යනම් තවත් ලක්ෂ 05 ක් වියදම් කරලා  කොට්ඨාශ 10 ද සිටින සියලුම ගැබිණි මාවුවරුන් සදහා ලබා දෙන්න. ඒක ගැටළුවක් නැහැ. අපිටත් සතුටුයි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මූල්‍ය කටයුතු පිළිබඳව ගරු සභාපතිතුමියට බලතල තිබෙනවා. ඒ අනුව මුදල් වැය කරලා තිබෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මුල්‍ය කමිටු වාර්තාව අනුමත කරනවාද?

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුල්‍ය කමිටු වාර්තාවේ මේ කරුණ පමණක් නොව වෙනත් කරුණු පිළිබඳවත් සාකච්ඡා කර තිබෙනවා. මෙහිදි සියලු කරුණු සදහා වියදම් කරලාද මෙම සභාවට ඉදිරිපත් කළේ? නැහැනේ. එසේනම් කොහොදම ක්‍රියාමාර්ගය වෙනස් වුණේ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
නල්ලතන්නියේ කොමිෂන් ටෙන්ඩර් මගින් ලබා දි ඇති වාහන රථගාලේ සිදුවන දේවල් පිළිබඳව යම්කිසි අවධානයක් යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි. එහිදි සිදුවන කරුණු සම්බන්ධයෙන් මම යම් කරුණු ටිකක් දැන ගත්තා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමනි, විගණන දෙපාර්තමේන්තුවෙනුත් මේ පිළිබඳව විමර්ශන කරන ලෙසට පවසලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අවසාන වශයෙන් එක් කරුණක් ඉදිරිපත් කරනවා. ගරු මන්ත්‍රී සුරේෂ්කුමාර් මැතිතුමා පවසන පරිදි නීතයානුකූලව ගරු සභාපතිතුමිය තමාගේ බලතල පාවිච්චි කරමින් ලක්ෂ පහකට අඩු වියදම් දැරීමට පුළුවන් කියන තීරණය ලබා ගන්නා ලෙසට ඉල්ලා සිටිමි. එසේ සිදු

කිරීම පහසුයි නේද? මෙන්න මේ වැඩසටහන් ක්‍රියාත්මක කළා යනුවෙන් සභාවේ දැනගැනීම සදහා ඉදිරිපත් කළාම ප්‍රමාණවත්.

**<u>ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මූල්‍ය කමිටු වාර්තාව නිවරැදි බවට මා යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>2022.02.21 හා 022.03.07 යන දිනයන් හි පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සදහා ඉදිරිපත් කරන ලදී.</u>**

**<u>2022.02.21 මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව</u>**

**කාරණා අංක 01**
2022 වර්ෂය සදහා මස්කෙළිය ප්‍රාදේශීය සභාව සදහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය වෙනුවෙන් කැදවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී..

**තීරණ අංක 05**
ඉදිරිපත් වූ මිල ගණන් අතරින් උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය සදහා අවම මිල ගණන් ඉදිරිපත් කල පේපර්ලයින් ට්‍රේඩින් හා එල්.එච් චන්ද්‍රසේකර සහ සහෝදරයෝ ආයතන වලින් සලකුණු කල පරිදි මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 02**
2022 වර්ෂය සදහා මස්කෙළිය ප්‍රාදේශීය සභාව සදහා අවශ්‍ය ටෝනර් වෙනුවෙන් කැදවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 06**
ඉදිරිපත් වූ මිල ගණන් අතරින් උසස් තත්ත්වයේ ටෝනර් සදහා අවම මිල ගණන් ඉදිරිපත් කල ද ඔෆිස් ෂොප් හා ෂාන් බුක් ෂොප් ආයතන වලින් සලකුණු කල පරිදි මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 03**
2022 වර්ෂය සදහා මස්කෙළිය ප්‍රාදේශීය සභාව සදහා අවශ්‍ය මුද්‍රණ සේවා වෙනුවෙන් කැදවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 07**
ඉදිරිපත් වූ මිල ගණන් අතරින් උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය සදහා අවම මිල ගණන් ඉදිරිපත් කල නිව් ජේ.එස් ප්‍රින්ටර්ස් ආයතනයෙන් මිලදී ගැනීම් සිදු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදි. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 04**
2022 වර්ෂය සඳහා මස්කෙළිය මහජන පුස්තකාලයට හා අප්කට් කියවීම් ශාලාව සඳහා අවශ්‍ය පුවත්පත් මිලදී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 08**
ඉදිරිපත් වූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කල සාමුන්දේස්වරී ෆාමසි ආයතනය මගින් පුවත්පත් මිලදී ගැනීම සඳහා මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 05**
2022 වර්ෂය සඳහා මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයට සහ පොහොර වෙළඳසැල සඳහා අවශ්‍ය සීලර් යන්ත්‍ර සඳහා කැඳවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 09**
ඉදිරිපත් වූ මිල ගණන් අතරින් වැඩි වගකීම් කාලයක් සහිත උසස් තත්ත්වයේ උපකරණ සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කල හොන් ඉලෙක්ට්‍රොනික් ආයතනයෙන් මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 06**
මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ පොහොර වෙළඳසැල සඳහා අවශ්‍ය ඉලෙක්ට්‍රොනික් තරාදියක් මිලදී ගැනීම සඳහා කැඳවූ මිල ගණන් පහත පරිදි ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 10**
ඉදිරිපත් වූ මිල ගණන් අතරින් වැඩි වගකීම් කාලයක් සහිත උසස් තත්ත්වයේ උපකරණ සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කල හොන් ඉලෙක්ට්‍රොනික් ආයතනයෙන් මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 07**
ZB 0394 අංක දරණ කම්පැක්ටර් රථය සඳහා අවශ්‍ය ටයර් සඳහා කැඳවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 11**
ඉදිරිපත් වූ මිල ගණන් අතරින් උසස් තත්ත්වයේ ටයර් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කල පෙරේරා ටයර් ආයතනය මගින් මිලදී ගැනීම් සිදු කිරීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදි. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 08**

ZB 0394 අංක දරණ කම්පැක්ටර් රථය සදහා අවශ්‍ය බැටරි සදහා කැදවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 12**

ඉදිරිපත් වූ මිල ගණන් අතරින් උසස් තත්ත්වයේ බැටරි සදහා අවම මිල ගණන් ඉදිරිපත් කල මස්කෙළිය ටයර් හවුස් ආයතනය මගින් මිලදී ගැනීම් සිදු කිරීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදි. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 09**

2022 වර්ෂය සදහා අවශ්‍ය බල්බ සදහා කැදවූ මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 13**

ඉදිරිපත් වූ මිල ගණන් අතරින් වැඩි වගකීම් කාලයක් සහිත උසස් තත්ත්වයේ බල්බ සදහා අවම මිල ගණන් ඉදිරිපත් කල එන් එම් අයි ඉන්ෆ්‍රා, නිව් ජෙම් සිටි,කේ.පී.එන්ටප්‍රයිසස්, ලෝටස් ට්‍රේඩ්වෙර්ස් හා ඒෂියන් ඉලෙක්ට්‍රිකල් යන ආයතන වලින් සලකුණු කල පරිදි භාණ්ඩ මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 10**

2022 වර්ෂය සදහා මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශය සදහා අවශ්‍ය භාණ්ඩ වෙනුවෙන් කැදවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 14**

ඉදිරිපත් වූ මිල ගණන් අතරින් පහත සදහන් අයිතමයන් සදහා වර්ගය **(Barnd)** සහිතව නැවත මිල ගණන් කැදවීමටත් අනෙකුත් අයිතමයන්ට අදාළව අවම මිල ගණන් ඉදිරිපත් කල පේපර් ලයින් ට්‍රේඩින්, චන්ද්‍රා ස්ටෝර්ස්, නිව් ශක්ති ස්ටෝර්ස් හා ආර්.එම්.පී.එන්.රත්නායක යන ආයතන වලින් සලකුණු කල පරිදි මිලදී ගැනීමටත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 11**

2022 වර්ෂය සදහා මස්කෙළිය ප්‍රාදේශීය සභාව සදහා අවශ්‍ය විදුලි උපකරණ වෙනුවෙන් කැදවන ලද මිල ගණන් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 15**

ඉදිරිපත් වූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් ආර්.එම්.පී.එන්.රත්නායක යන ආයතන වලින් සලකුණු කල පරිදි මිලදී ගැනීමටත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 12**
2022 වර්ෂයේ අය වැය යෝජනාවෙන් කාන්තා සංවර්ධනය සඳහා වෙන්කළ මුදලින් ගැබිණි මවුවරුන් හට භාණ්ඩ ලබාදීම සඳහා කැඳවන ලද මිළ ගනන් විවෘත කරන ලදී.

**තීරණ අංක 16**
ඉහත කරුණට අදාලව මිල ගණන් කැදවීමට සභාව විසින් තිරණය කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**2022.03.07 මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව**

**කාරණා අංක 01**
2022 වර්ෂයේ අය වැය යෝජනාවෙන් කාන්තා සංවර්ධනය සඳහා වෙන්කළ මුදලින් ගැබිණි මවුවරුන් හට භාණ්ඩ ලබාදීම සඳහා කැඳවන ලද මිළ ගනන් විවෘත කරන ලදී.

**තීරණ අංක 17**
මෙම ද්‍රව්‍ය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කල උදයම්ස් වෙළද ආයතනයෙන් මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. ගරු සභාපතිතුමිය වෙත පැවරී තිබෙන මූල්‍යතම බලතලය වන රු.500000.00 ට අඩු ව්‍යාපෘති හෝ වැඩසටහන් සභාපතිතුමියගේ අණ පරිදි සිදුකළ හැකි බව සඳහන් කරමින් 2020.02.11 දින පැවති මහා සභාවේ දී තීරණ අංක 03 යටතේ ලබාගත් තීරණයට ගරුසභාපතිතුමිය මගින් ක්‍රියාත්මක කළ ගැබිණි මවුවරුන් සඳහා ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහන සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු ලබාදෙන ලදී. තවද මෙම වැඩසටහන සම්බන්ධව මූල්‍ය කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලැබීමෙන් පසු අදාල ද්‍රවය සඳහා මිළ ගණන් කැදවා එම මිල ගණන් මුලය කමිටුව වෙත ඉදිරිපත් කර මෙම ද්‍රවය ගෙන්වා ගැබිණි මවුවරුන් සඳහා බෙදාදෙන ලදී. ඒ අනුව මෙම මුදල් කමිටු වාර්තාව සම්මත කරන ලදී.

**කාරණා අංක 02**
පොහොර කඩය පුළුල් කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ මිළදී ගැනිමට සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 18**
ඉහත කරුණට අදාලව භාණ්ඩ මිළදී ගැනීම සඳහා, මුදල් කමිටුවේ සාමාජිකයින් 04 දෙනෙක් හා කාර්යාලයේ නිලධාරීන් 02 නෙක් ගොස් එම භාණ්ඩ මිළදී ගැනීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. සෞඛ්‍ය අංශයට අවශ්‍ය උපකරණ සඳහා ක්‍රොකඩයිල් වර්ගයෙන් මිල ගණන් නැවත කැදවීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 03**
කාර්යාලයේ ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීමට අදාල මිළ ගණන් කැදවීමේදි, මිළ ගණන් ක්ෂණිකව වෙනස් වීම හා දැනට පවතින ඉන්ධන ප්‍රශ්නය නිසා එම භාණ්ඩ ප්‍රවාහනය කරදීමට අපහසු බැවින් එම භාණ්ඩ මිළදී ගැනීම සඳහා අපම එම වෙළඳ ස්ථානයට ගොස් එම භාණ්ඩ මිළදී ගැනිමට ඇති හැකියාව පිළිබඳ සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 19**
සභාව මගින් ප්‍රවාහන වියදම් දරා අවශ්‍ය භාණ්ඩ මිළදී ගැනීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 04**
මෝහිනී ඇල්ල ප්‍රෙද්ශයේ පානීය ජලයට අපවිත්‍ර ජලය මුසු වී ඇති බව සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 20**
අදාල ස්ථානයන් හි අපවිත්‍ර ජලය භාවිතයට නොගන්නා ලෙස දැන්වීම්පුවරු සවිකිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මීළඟට ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
සාමිමලේ, නල්ලතන්නිය, ලකම් වැනි ප්‍රදේශ වල ආයුර්වේද රෝහල් ස්ථාපිත කිරීම පිළිබඳව මාගේ පළමුවන යෝජනාව ඉදිරිපත් කරමි. මස්කෙළිය ආයුර්වේද රෝහලේ වෛද්‍යවරුන් දෙදෙනෙක් සිටිනවා. එම දෙදෙනාටම එතරම් අධික රාජකාරියක් නොමැති බවට මා අදහස් කරමි. එනිසා උප ආයුර්වේද රෝහල් ස්ථාපිත කිරීමෙන් සතියකට එක දවසක් හෝ එම ප්‍රදේශ වල රෝගීන් පරීක්ෂා කිරීමට සහ බෙහෙත් ලබා දීමට පහසු වේවි. තවද පවතින මෙම තත්වය තුල නගරයට පැමිණීම ඉතා අපහසුයි. දැනට ගමන් වියදම් ද ඉතා අධිකයි. එනිසා ඒ ඒ ප්‍රදේශවල මෙම ආයුර්වේද රෝහල් ස්ථාපිත කර දීමෙන් එය විශාල පහසුවක් වේවි.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**
ගරු ආනන්දන් මැතිතුමා පැවසූ පරිදි එම යෝජනාව ඉතා වැදගත්. මස්කෙළිය නගරයේ ආයුර්වේද රෝහලක් ඇතිබව කොට්ඨාශ 10 යේම සිටින ජනතාව මේ වනතුරුත් දැනුවත් වෙලා නැහැ. මෙම  කොට්ඨාශ තුන හතරක් එකතු කර ප්‍රධාන ආයුර්වේද මධ්‍යස්ථානයක් ඇති කරනවා නම් සුදුසුයි කියා මා යෝජනා කරනවා. මේ අවස්ථාවේදී ආනන්දන් මන්ත්‍රීතුමා මෙම යෝජනාව ඉදිරිපත් කිරීම වෙනුවෙන් මාගේ ස්තූතිය එතුමාට පුදකර සිටිනවා. හොද යෝජනාවක්. මස්කෙළිය ප්‍රාදේශීය සභාව ආරම්භකර දැනට අවුරුදු 04 ක් අවසන් වීමට පැමිණියත් මේ වන විට 100 කට අධික පිරිසක් වත් ආයුර්වේද මධ්‍යස්ථානයට පැමිණ නැති බවයි මාගේ අදහස. මස්කෙළිය ආයුර්වේද රෝහල පිළිබඳව ජනතාව දැනුවත් වී නැහැ. එනිසා මෙම යෝජනාව සදහා සභාවෙන් අනුමැතිය ලබා ගෙන මෙවැනි ආයුර්වේද මධ්‍යස්ථාන කිහිපයක් බිහි කිරීමට කටයුතු කරන ලෙස මාගේ යෝජනාව සභාවට ඉදිරිපත් කර සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම යෝජනා සභා සම්මත වුවහොත් මේ සදහා වූ ක්‍රියාමාර්ගය සදහා ඉතා ඉක්මනින් කටයුතු කළ යුතුයි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු මන්ත්‍රී ආනන්දන් මැතිතුමාගේ යෝජනාව ස්ථීර කරන අතර එතුමා සාමිමලේ, නල්ලතන්නිය, ලකම් යන ප්‍රදේශ සඳහා ආයුර්වේද රෝහල් මධ්‍යස්ථාන ඉල්ලා සිටිනවා. ඒ සඳහා සතියකට එක දවසක් අපගේ වෛද්‍යවරුන් ඉදිරිපත් වී වෛද්‍ය සේවාව ලබාදේවි. ඒ සඳහා විකල්ප මාර්ග බෙහෝ ඇත. ගොඩනැගිලි ලබාගැනීම සඳහා විශාල ගැටළුවක් මතු වෙන්නේ නැහැ. කුලියට වුවත් ගොඩනැගිලි ලබාගත හැකියි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ඉතා හොද කාර්යයක්. අනිවාර්යයෙන් මෙම යෝජනාව ක්‍රියාත්මක කළ යුතුයි. නමුත් මේ සඳහා වූ වියදම් කටයුතු කවුද සිදු කරන්නේ? සභාවේ ප්‍රතිපාදන නම් මූල්‍ය කමිටුවට ඉදිරිපත් වෙනවා. පසුව එහිදි ගැටළු මතු වෙනවා. එනිසා මේ පිළිබඳව අවධානය යොමු කරන්න. සභාවේ ප්‍රතිපාදන භාවිතා කරනවාද? නැතිනම් ගරු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික මුදල් භාවිතා කරනවාද?

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු සභාපතිතුමියනි, සභාවට යෝජනාවක් ඉදිරිපත් කර තීරණයක් ලබා ගන්නා අවස්ථාවේදී අපේ පෞද්ගලික මුදල් ලබා දෙන්නම්. ආයුර්වේද රෝහලක් ස්ථාපිත කරන්න කියලා කිසිම මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් වුණේ නැහැ. මූල්‍ය කමිටුව සම්බන්ධව මතු වූ ගැටළුව වෙනත් එකක්. එතුමා හොද උගත් ගුරුවරයෙක්. එනිසා මෙම කාරණාව පැහැදිලි වේවි. සභාවේදී ලබා ගන්නා තීරණ සඳහා පෞද්ගලික මුදල් වැය කලයුතු අවශයතාවයක් නැහැ. සභාවේ මුදල් තමයි වැය කරන්නේ. මෙය වෙනත් ආකාරයක ගැටළුවක් කර ගන්න එපා. සභාව සාමකාමීව පවත්වාගෙන යා යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මොහොතකට පෙර මූල්‍ය කමිටුව පිළබඳව ගැටළුවක් මතු වූ නිසා තමයි එතුමා මෙහෙම කිව්වේ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

වැය කටයුතු සිදු කිරිමේදී කවුද වැය කරන්නේ? සභාවේ ප්‍රතිපාදන වැය කළාම අනවශ්‍ය වැය කිරිම් සිදුකළ බවට ඔබතුමා අහනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මොහොතකට පෙර මූල්‍ය කමිටුව පිළබඳව ප්‍රශ්නයක් මතු වුණා. ඒ හේතුව නිසා තමයි ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා මෙය මතු කරලා පෙන්වන්න ඉදිරිපත් වුණේ.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මූල්‍ය කමිටුවේදී මතු වූ ගැටළුව සම්බන්ධව ඊට පෙරාතුව යෝජනාවක් ඉදිරිපත් කර තාබුණාද? එකී කාරණාව සභාවට ඉදිරිපත් කර තිබුණා නම් අපි තීරණයක් ලබා ගෙන ඇති නේද? එසේ නම් 30 දෙනෙකුට පමණක් නොවෙයි 50 දෙනෙකුට අනුමැතියනක් ලබා දෙනවා.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

ආයුර්වේද රෝහලක් පවත්වාගෙන යාමට සභාව වියදම් කළ යුතු නැහැ. වෛද්‍යවරුන්ට සභාවෙන්ද වැටුප් ගෙවන්නේ?, නැහැ නේද? බෙහෙත් මිළදී ගැනිම සඳහා මුදල් වැය කරනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ඔව් අයවැය වාර්තාවෙන් වෙන් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

දැනටමත් ආයුර්වේද බෙහෙත් තොගයක් කල් ඉකුත් වී ඇති බවට පවසනවා. එක්තරා ප්‍රතිලාභීන් සදහා ලබා දිය හැකි බෙහෙත් තොගයක් කල් ඉකුත් වී යනවා. මීට පෙරද බෙහෙත් කල් ඉකුත් වීමට නියමිත බව දැනගෙන සභාවේ අනුමැතිය ලබා ගනිමින් කොටගල, අඹගමුව රෝහල් වලට එය ලබා දුන්නා. පසුගිය අවුරුදු 02 කට පෙර මෙවැනි තත්වයක් උදාවූ අවස්ථාවේදී ජංගම සේවයක් මගින් බෙහෙත් ලබා දීමට කටයුතු කළා. සභාව යටතේ ඇති රෝහල ව්‍යුහගත කළ යුතු බවටයි මා ඉල්ලා සිටින්නේ. අවශ්‍යනම් මෙම ලිපිය මධ්‍යම පළාතේ ආයුර්වේද දෙපාර්තමේන්තුවට යොමු කරමින් එම දෙපාර්තමේන්තුව මගින් වුවද මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ හැකියි. පක්ෂ නැතිනම් ජාති, ආගම්,භේද බලමින් මෙම කරුණු ඉදිරිපත් කළේ නැහැ. මෙම යෝජනාව ක්‍රියාත්මක කළ හොත් සියළු දෙනාටම ප්‍රයෝජනවත් වේවි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මම ආයුර්වේද ජංගම සේවාවක් පිළිබඳ වූ යෝජනාවක් ඉදිරිපත් කරළා තියෙනවා. නමුත් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව වන්නේ ආයුර්වේද උප මධ්‍යස්ථාන පිහිටුවීම පිළිබඳවයි. එනිසා ඒ අනුව ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

සාමිමලේ පුස්තකාලයේත්, නල්ලතන්නියේ අපගේ උප කාර්යාලයේත් ස්ථානයක් වෙන් කර ගන්න පුළුවන්. ලකම් එකේ ස්ථානයක් ඉල්ලා ගනිමු.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

වතු බෙහෙත් ශාලා වලද අපට ස්ථානයක් ලබාගත හැකියි.

**තීරණ අංක 21**

පළමුව එකී ප්‍රදේශ හතරට (සාමිමලේ, ලකම්, නල්ලතන්නිය, ගාර්ට්මෝර්) ආයුර්වේද ජංගම සේවාවක් ක්‍රියාත්මක කිරීමටද ඒ සමගම මේ ස්ථාන වල ස්ථිර ආයුර්වේද උප ආයුර්වේද මධ්‍යස්ථාන ඉදිකිරීමටද තීරණය කරන ලදි.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

මාගේ දෙවන යෝජනාව වන්නේ මස්කෙළිය ආයුර්වේද රෝහල පහසුකම් සහිත ගොඩනැගිල්ලකට මැරු කිරීම හෝ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සම්බන්ධවයි. එම ස්ථානයට පැමිණෙන රෝගීන්ට අවශ්‍ය ඉඩ පහසුකම් හා වැසිකිළි වැනි පහසුකම් නැහැ. වෛද්‍යවරුන්ට අවශ්‍ය වැසිකිළි පහසුකම් පමණයි තිබෙන්නේ. මේනිසා එම ස්ථානයට පැමිණෙන රෝගීන් විශාල අපහසුතාවයන්ට මුහුණ දෙනවා. මේ සදහා සුදුසු තීරණයක් ලබා දෙන ලෙස මා සභාවෙන් ඉල්ලා සිටිනවා.

**තීරණ අංක 22**

මෙම කරුණු පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

මාගේ මීළඟ යෝජනාව වනුයේ ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් ලබා දෙන ඉල්ලුම් පත්‍රය සිංහල භාෂාවෙන් පමණක් තිබෙනවා. මේ නිසා බොහෝ දෙනෙකුට භාෂා ගැටළුවක් මතු වෙනවා. මෙම ප්‍රදේශයේ වැඩි වශයෙන් දෙමළ භාෂාව කතා කරන ජනතාව ජීවත් වන නිසා අනිවාර්යයෙන් දෙමළ භාෂාවෙන්ද මෙම ඉල්ලුම් පත්‍ර සහ ගිවිසුම් ඉදිරිපත් කළ යුතු බවට ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත ඉල්ලීමක් සිදු කළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මීළඟට ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසය ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මා විසින් යෝජනා 05 ක් ඉදිරිපත් කරලා තිබුණා. ඉන් යෝජනා 03 ක් පමණයි න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙන්නේ. ඉතිරි යෝජනා 02 ක ඉදිරිපත් කර නැති බවට ලිපියක් යොමු කර තිබෙනවා. මෙහිදි විහිළුකට කාරණාවක් වන්නේ ගරු මන්ත්‍රී ආනන්දන් මැතිතුමා ආයුර්වේද ගොඩනැගිල්ලක් අවශ්‍ය බවට යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. ඒ අනුව එයට තීරණයක් ලබාගෙන ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අපි කටයුතු කිරීමට නියමිතයි. මෙම මස්කෙළිය රෝහලේ වයසට ගිය වැඩිහිටියන් ලේ පරීක්ෂා කර වාර්තාව ලබා ගැනීමේදී බොහෝ අපහසුතාවලට මහුණ දෙනවා. අතැම්විට ග්ලැන්කන් රෝහල වෙත ගොස් ලබාගන්න ඕන. නැතිනම් පෞද්ගලික රෝහලකට යන්න ඕන. ඒ සම්බන්ධව ඖෂධ රසායනාගාර නිලධාරීවරයෙක් ලබාදෙන ලෙසට මම යෝජනාවක් ඉදිරිපත් කළා. නමුත් එම යෝජනාවට අනුමැතිය ලබා දුන්නේ නැහැ. ඒ සම්බන්ධව ලේකම්තුමාගෙන් විමසන අවස්ථාවේදී ප්‍රදේශයේ ජනතාවගෙන් ඉල්ලීම් ලිපියක් සකස්කර අත්සන් ලබාගෙන එන්න. එවිට එයට ලිපියක් යොමුකල හැකි යැයි පිළිතුරු දුන්නා. ජනතාව තම නියෝජිතයන් පත් කරමින් ඔවුන්ගේ ප්‍රශ්න කතා කිරීම සදහා තමයි අපිව නියෝජිතයන් වශයෙන් පත් කර එවන්නේ. ලිපි රැගෙන විත් කතාකල යුතු නම් අපි මෙතැනට අවශ්‍ය නැහැනේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මහජනතාවගෙන් ලිපියක් රැගෙන එන්න කිවුවේ නැහැ. ඔබතුමාගෙන් ලිපියක් ලබා දෙන ලෙසයි ඉල්ලා සිටියේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු සභාතිතුමියනි, මෙතෙක් කල් මන්ත්‍රීවරයෙක් ලිපියක් රැගෙන විත් එය ඉදිරිපත් කර ද කතා කළේ. රෝහල සම්බන්ධව නේද මම කතා කළේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ආයුර්වේද රෝහල යනු සභාවට අයත් ආයතනයක්. නමුත් පොදු රෝහල කියන්නේ අපේ සභා පරිපාලනයෙන් පරිබාහිර එකක්.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

පසුගිය කාල වකවාණු වලදී රෝහල පිළිබඳව විවිධ කරුණු සාකච්ඡා කර ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපි යොමු කරමින් විවිධ ජයග්‍රහණ ලබාගෙන තිබෙනවා නේද? දැනට ලේ පරීක්ෂා කිරීමේ රසායනාගාර මධ්‍යස්ථානයක් තිබෙනවා. ඒ සදහා අවශ්‍ය රසායනාගාර පරීක්ෂණ නිලධාරී මහත්මයෙක් අවශ්‍යයි කියන එකයි අපගේ ඉල්ලීම.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මැතකදී රසායනාගාර පරික්ෂණ තාක්ෂණ නිලධාරී මහතෙක් මස්කෙළිය රෝහල වෙත පත්විම් ලබා පැමිණීමට නියමිතයි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මේ කාරණාව පිළබඳව මහජනතාව විශාල අපහසුතාවයන්ට පත්වෙනවා. මීළඟ කාරණාව වශයෙන් සදහන් කරන්නේ සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරීවරුන් හට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් නැහැ. සියලුම නිලධාරීන් එකම කාර්යාල පරිසරයක් තුල හමුවීමේ වැඩ සටහනක් යහපාලනය රජයේදී 'නිල සෙවන' යන නමින් ව්‍යාපෘතියක් සිදුකළා. මස්කෙළියටත් ලැබුණා. මෙහිදී සමෘද්ධි නිලධාරී, ග්‍රාම සේවා නිලධාරී යන සියලු දෙනාම තාවකාලික කාර්යාලවලයි සිටින්නේ. සියලුම කොට්ඨාශ වල මෙම ගැටළුව තිබෙනවා. ඒ ඒ ප්‍රදේශ වල පර්චස් 10 ක බිම් කොටසක් ලැබුණොත් සියලුම නිලධාරීන්හට එකම ස්ථානයක ඉන්න පුළුවන්. මහජනතාවටත් සේවාව ලබා ගැනීමට පහසු වේවි. මෙය තමයි මාගේ යෝජනාව. මෙම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් කර නොමැති බව පවසනවා. එය මාගේ හිතට වේදනාවක්. මීළඟ යෝජනාව ඉදිරිපත් කරන්නම්. මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජීවත් වන ජනතාව සදහා ජංගම සේවාවක් ලබාදිය යුතුයි. උප්පැන්න සහතිකයක් ලබා ගැනීමට පවා බොහෝ අය අපහසුතාවයට පත් වෙනවා. ජාතික හැදුනුම්පත් ලබා ගැනිමේ අවශ්‍යතාවයක් ද තිබෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ලබන මස 12 වන දින සිතගඟුල ප්‍රදේශයටත් ඉන් පසු මාස 06 ක් තුල මෙම ප්‍රදේශයටත් ජංගම සේවාවක් සංවිධානය කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ප්‍රදේශ 03 ක් එක්කරමිනුයි සංවිධානය කර ඇති බව පවසන්නේ. කොට්ඨාශ මට්ටමින් සිදුකළහොත් පහසු වේවි. එනිසා මෙම කාරණාවත් ඇතුලත් කරන්න. කොට්ඨාශ මට්ටමින් එක් කොට්ඨාශයක් සදහා එක් ජංගම සේවාවක් සංවිධානය කර දෙන ලෙසට දිස්ත්‍රික් ලේකම්තුමා වෙත ඉල්ලීමක් කරන්න. මාස 08 ක් ගත වෙලත් මරණ සහතිකයක් ගන්න බැරිව සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී පී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා ගොඩනැගිලි පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. මම වත්තට අයත් ගොඩනැගිල්ලක් පසුගිය අවුරුදු 04 ක් සදහා සමෘද්ධි නිලධාරි සදහා ලබා දී තිබුණා. එම ගොඩනැගිල්ලට තහඩු මාරු කිරීම සදහා සූදානම් කර තිබුණා. එම කාර්ය සිදු කළ ක්ෂේත්‍ර නිලධාරි මහතා අනෙකුත් සියලු ස්ථාන වල තහඩු මාරු කර මෙම ගොඩනැගිල්ල සමෘද්ධි නිලධාරීන්ට සම්බන්ධ එකක්. ඒ නිසා සමෘද්ධි නිලධාරීගෙන් රුපියල් 5000.00 ක මුදලක් ලබා ගන්න කියා පවසා තිබෙනවා. මේ පිළිබඳව මාහට දැනුම් දුන් වහාම වතු අධිකාරි සමග සාකච්ඡා කර වහාම තහඩු මාරුකර දුන්නා. තහඩු මාරු කළ පසු එකී කාමරයේ යතුර සමෘද්ධි නිලධාරී ලග තිබෙන නිසා ඇණ ගසා වසා දැම්මා. සමෘද්ධි නිලධාරීතුමාගේ සියලුම ලිපි ලේඛන එම කාමරය තුලයි තිබෙන්නේ. එනිසා ගරු සභාපතිතුමිය මගින් මේ සම්බන්ධව ලිපියක් යොමු කරන්න.

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**
දැනට පහ වසර ශිෂත්ව විගායෙන් සමත් වු සියලුම සිසුන්හට මාගේ සුභ පැතුම් පුද කරන අතර මාගේ කොට්ඨාශයට සහ ගරු මන්ත්‍රී එස්. සුරේෂ්කුමාර් මැතිතුමාගේ කොට්ඨාශයට 05 වන මාසයේ 12 වැනි දින මෙම ජංගම සේවාවන් සිදු කිරීමට නියමිතව තිබුණා. නමුත් බැතිමතුන්ගේ පැමිණීම නිසා එම ජංගම සේවාව 06 වන මස 12 වන දිනට වෙනස් කර තිබෙනවා. තවද ඉඩම් ඔප්පු ලබාදීමේ ජංගම සේවාව 12 වන දින පැවැත්වීමට නියමිතයි. අප ප්‍රදේශයේ ග්‍රාමසේවා නිලධාරී මහතා විසින් ප්‍රාදේශීය ලේකම් මහතා වෙත කරන ලද ඉල්ලීමකට අනුව මෙම ජංගම සේවාවන් සිදු කිරීමට නියමිතයි.

**ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා (එ.ජා.නි.පෙ)**
ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව බලවත් කරමින් මාගේ කොට්ඨාශයේත් බොහෝ දෙනෙක් මරණ සහතිකය ලබා ගැනීමට නොහැකිව සිටිනවා. ලබා ගැනීමට නොහැකිව තිබු මරණ සහතික කිහිපයක් පිළිබඳව වතු වෛද්‍ය නිලධීතුමාගේ නිර්දේශය ලිපි ලබා ගනිමින් ගරු අධිකරණය මගින් ලබා දී තිබෙනවා. තවද වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ නිලධාරීවරයෙක් ලබා ගැනීම සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කරමින් ගරු මන්ත්‍රීතුමා සිත් තැවුලෙන් කතා කළා. E4D ආායනයේ අධ්‍යක්ෂකතුමාගේ මැදිහත් වීමෙන් තළවකැලේ සිට වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ නිලධාරි මහතෙක් මස්කෙළිය රෝහලට පැමිණීමට නියමිතයි. E4D ආයතනය මෙම කාර්ය ඉටුකර දීමට ඉදිරිපත්වී සිටිනවා.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ජූනි මාසයේ සියලුම ප්‍රදේශ සදහා ජංගම සේවාවන් සිදු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තීරණය කර තිබෙනවා. මාවුස්සාකැලේ කොට්ඨාශයේ ජංගම සේවාව සිදු කිරීමට අවශ්‍ය මුලික කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ සදහා දිනයක් නියම කර අවශ්‍ය ලේඛන සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිතයි. හදිසි මරණ පරීක්ෂකවරයෙක් නොමැති නිසා මරණ සහතික ලබා ගැනිමේ දී ගැටලු මතු වී තිබෙනවා. අප ප්‍රදේශයට හදිසි මරණ පරික්ෂක වරයෙක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ හොත් මෙම මරණ සහතික ලබා ගැනීමේදි මතුව ඇති ගැටළුවට විසදුමක් ලබාගත හැකියි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ඒ සදහා අවශ්‍ය කටයුතු සිදුකර තිබෙනවා.

**ගරු මන්ත්‍රිනී කේ.ජී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)**
සභාපතිතුමියනි, මස්කෙළිය ඉන්ධන පිරවුම් හල ශ්‍රී පාද වන්දනාව සදහා පැමිණෙන ජනතාව වෙනුවෙන් දිවා රාත්‍රී සේවාවක් ලෙස ලබා දීමට කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. රාත්‍රී 10 න් පසු පැමිණෙන වන්දනා කරුවන්ගේ අවශ්‍යතාවය මත ඔවුන්ට ඉන්ධන ලබා ගැනීමට ස්ථානයක් මස්කෙළිය නගරයේ නොමැති වීම නිසා ඔවුන්ට ඇති වන අපහසුතා මගහරවා ගැනීම සදහා ඉන්ධන ලබාදීම දිවා රාත්‍රී සේවයක් බවට පත් කරන්න.

**තීරණ අංක 23**
එක් එක් කොට්ඨාශ සදහා වෙන වෙනම ජංගම සේවා පවත්වන ලෙස ඉල්ලා සිටිමින් ප්‍රාදේශීය දිස්ත්‍රික් ලේකම්වරු වෙත ලිපි යොමු කිරිමට තීරණය කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මස්කෙළිය ප්‍රදේශයේ දැනට එකම පවුලක උප පවුල් ඒකක ප්‍රමාණයක් ජීවත් වෙනවා. එම පවුල් ඡන්ද නාම ලේඛනයට තනි පවුල් ඒකක වශයෙන් ලියාපදිංචි කළ යුතුයි. දැනට නිවෙස් කරා ගොස් ඡන්ද නාම ලේඛන සකස් කර සිටිනවා. පසුගිය අවස්ථාවේදී රු.5000.00 ක දීමනාව ලබා දීමේදී මේ නිසා විවිධ ගැටළු මතුවෙලා තිබුණා. මෑතකදී මම නිවසකට ගියා. එම පවුලේ උප පවුල් ඒකක 04 ක් ජීවත් වෙනවා. ඡන්ද නාම ලේඛන සකස් කිරිමේදී නිවසක පිහිටි එක් දොරකඩකට එක් ඡන්ද නාම ලේඛනයක් පමණයි තියෙන්නේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

දැනට උප පවුල් ඒකක සිටිනවා නම් ඒවාට වෙනම ඉල්ලුම් පත්‍ර සපයනවා නේද?

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

නැහැ අපගේ කොට්ඨාශයේ එහෙම නැහැ. නිවසක් ලබාදීමේදී නැතිනම් වෙනත් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේදී මෙවැනි උප පවුල් ජීවත්වෙන එක පවුලකට ලබා දෙනවද? එසේ නැතිනම් කුඩාරම් වල ජීවත් වෙන අයට ලබා දෙනවද? මෙවැනි කටයුතු වලදි ගැටළු මතු වෙනවා. එනිසා මෙවැනි උප පවුල් ඒකක වෙන්කර වෙනම පවුල් වශයෙන් ඡන්ද නාම ලේඛනයට ඇතුලත් කිරිම සදහා ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යවන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

අපගේ කොට්ඨාශයේ සහ ගරු මන්ත්‍රී නිත්‍යානන්දන් මැතිතුමාගේ කොට්ඨාශයේත් විශාල ගැටළු පවතිනවා. මෙම වතාවේදි ඉල්ලුම් පත්‍ර ලබා නොදෙන බවටත්, පසුගිය වර්ෂයේ පිටපත සහ ජාතික හැදුනුම්පත රැගෙන ආවොත් අපි මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාඉදිංචි කරන බවටත් අප කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි මහතා පවසනවා. මෙම පණිවිඩය සියලුම දෙනාට ලබාදෙන ලෙසටත් කියා සිටිනවා. රුපියල් 5000.00 ලබාදෙන අවස්ථාවේදී බොහෝ පවුල්වලට මෙවැනි ගැටළු මතුවුණ නිසා මේ සදහා නිසි ක්‍රියාමාර්ගයක් ගත යුතුයි.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙය මැතිවරණය හා සම්බන්ධ කරුණක් නිසා මැතිවරණ කොමසාරිස් වෙත ලිපියක් යොමු කළ යුතුයි. මාවුස්සකැලේ කෙට්ඨාශයේ අළුතෙන් පවුල් 600 ක් 700 ක් පමණ ලියා පදිංචිකර තිබෙනවා. සමහර ග්‍රාම සේවා නිලධාරීන්ගේ මතය අනුව මෙම කාර්ය සිදු වී තිබෙනවා.

**තීරණ අංක 24**

ඉහත යෝජනාව සම්බන්ධෙයන් මැතිවරණ කොමසාරිස්තුමාට සහ දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් වරුන්ට ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මීළඟට ඉදිරිපත් කරන්නේ ආයුර්වේද සේවාව පිළිබඳවයි. බොහෝ කල් ඉකුත් වී තිබෙනවා කියන්නේ එය අපේ වරදක් නොවෙයි. එය වෛද්‍ය වරුන්ගේ වරදක් බොහෝ කල් ඉකුත් වීමට පෙර ඒ පිළිබඳව ලේකම්තුමාට දැනුම්දීලා තිබුණා නම් ඊට අවශ්‍ය කටයුතු සිදු කරන්න තිබුණා. ඉදිරියේදී මෙවැනි සිදුවීම් නොවීමට අවශ්‍ය කටයුතු කරන්න. සති අන්ත දිනවල මෙම ජංගම සේවාව සංවිධානය කරමු. වයෝවෘද්ධ අයට නගරයට පැමිණීම අපහසු බැවින් මෙම ජංගම සේවාව සිදු කිරීමෙන් ඒ අයට සහනදායි වේ.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

ගරු මන්ත්‍රී කේ.ජී.කේ.පෙර්රා මැතිනිය ඉදිරිපත් කළ යෝජනාව ඉතාමත් වටින කාරණාවක්. මේ පිළිබඳව අපි විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලිපියක් යොමු කළ යුතුයි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මේ සමග අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කරමි.

ස්තූතියි.
ආයුබෝවන්.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.